**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2021**

---

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2021 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2022 නොවැම්බර් 16 දින වන විට මාස 08 ක් ප්‍රමාද වී තිබුණද, විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2023 වර්ෂය වන විට ඉදිරිපත් කිරීමට සූදානම් කෙරෙමින් පවතී. | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගත යුතුය. |

### 2.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසිය 756, 757 | 2021 දෙසැම්බර් 31දිනට පිරිවැය රු.113,668,167 ක්වූ මිලදී ගත් පොත් තොගය සහ ජාතික පුස්තකාලයේ සංරක්ෂිත පොත් තොගය සමාලෝචිත වර්ෂය තුළදී ද සමීක්ෂණය කර නොතිබුණි. | පොත් එකතුව කුඩා කාණ්ඩවලින් පැවතීම හා අඛණ්ඩව පාඨක සේවාව සැපයිය යුතු නිසා වාර්ෂිකව එකවර සමීක්ෂණය සිදු නොකරන ලද අතර 2023 වර්ෂයේ සිට අදියර වශයෙන් | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සමීක්ෂණය කිරීමට අභ්‍යන්තර සැලැස්මක් සකස් කරමින් පවතී. | |
| (ii) | මුදල්රෙගුලාසි 1647 (ආ) | මණ්ඩලය සතු පිරිවැය රු.32,270,762 ක් වූ වාහන 07 ක් හා මූල්‍ය කල්බදු වාහන 02 ක් සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ පවත්වා නොතිබුණි. | ඉදිරියේදී වාහන හා උපකරණ පිළිබඳව ද වාර්ෂික සමීක්ෂණ සිදුකිරීමට නියමිතය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත | | | |
| | (i) 12(2) (අ) හා (ආ) වගන්ති | (ii) පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳව ජාතික සංචිතයට ඇතුළත් අයිතම 2015 වර්ෂයේදී නව පුස්තකාල තොරතුරු කළමනාකරණ පද්ධතියකට ඇතුළත් කිරීමේදී අයිතම 330,228 ක් ඇතුළත්වී නොතිබුණු අතර ඇතුළත් වූ අයිතම්වලද සමහර දත්ත සාවද්‍ය වූයෙන් පාඨකයින්ට මෙම සම්පත් පරිශීලනය කිරීමේ අවස්ථාව අහිමි වී තිබුණි. 2015 වර්ෂය දක්වා අයිතම දස ලක්ෂයක් පවතින බව අනුමානකර පරිග්‍රහණ අංක වෙන්කලද ඉදිරිපත්කල දත්ත අනුව අයිතම 503,532 ක් විය. එම අනුමාන කිරීම හේතුවෙන් පරිග්‍රහණ ලේඛනයේ අංක 496,468 ක් අතිරික්තව පැවතීම අනාවරණය කර නොතිබුණි. | අනුමාන කර නව අත්පත් කරගැනීම් නව දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට නිශ්චිත කඩඉමක් ලෙස දස ලක්ෂය තෝරාගෙන ඇත. දත්ත පද්ධතියට ඇතුළත් නොවූ දත්ත ඇතුළත් කිරීමට 2016, 2020, 2022 වර්ෂවලදී යෝජනා වූ නමුත් මුදල් හිඟකම හා කාර්ය මණ්ඩල ගැටළු හේතුවෙන් එම කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය. මේ වන විට තාවකාලික පුහුණුවන්නන් යොදා ගෙන දත්ත ඇතුළත් කර තිබේ. | පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳව ජාතික සංචිතය විධිමත්ව ස්ථාපිත කර ක්‍රමවත්ව හා කාර්යක්ෂම පවත්වා ගෙන යා යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | (ii) පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳව ජාතික සංචිතයක් ලබාදීම, දේශීය හා විදේශීය ප්‍රලේඛන ද්‍රව්‍ය සංචිතයක් පිහිටුවීම, වැඩිදියුණු කිරීම, පවත්වාගෙන යාම හා සංරක්ෂණය සම්බන්ධයෙන් මණ්ඩලයට පැවරී තිබෙන කාර්යයන් ඉටුකිරීමේ ප්‍රගතිය සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන, ප්‍රතිග්‍රහන හා ග්‍රන්ථ විඥාපන පාලන අංශවල ප්‍රගති වාර්තාවලින් පිළිබිඹු වී නොතිබුණු අතර එම අංශවල පිළිවෙලින් ඒකක 5,288ක්, 1,880 ක් හා 33,353 ක් අතරැදී තිබුණි. | එම අංශවල මාසික ප්‍රගති වාර්තා නව ආකෘතිය අනුව සැකසීම 2022 සැප්තැම්බර් සිට ආරම්භකර ඇත. අදාල අංශවල අතරැදි කාර්යයන් ඉටුකරමින් පවතී. | පනත ප්‍රකාරව මණ්ඩලයට පැවරි ඇති කාර්යයභාරය, කාර්යක්ෂමව ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 12(2) (උ) වගන්තිය | ග්‍රන්ථ නාමවලිය ප්‍රකාශයට පත්කළ යුතු කාලවකවානුව නියම කර නොතිබුණු අතර 2019, 2020 හා 2021 වර්ෂවල ප්‍රමාද වී ග්‍රන්ථ නාමාවලි ප්‍රකාශයට පත් කර තිබුණි. | 2018 වර්ෂයේ සිට සිදුකරන නවීකරණ කටයුතු සහ කොරෝනා තත්ත්වය හේතුවෙන් උපරිම මාස 15 දක්වා ප්‍රමාදයකින් ශ්‍රී ලංකා ග්‍රන්ථ නාමාවලිය ප්‍රකාශයට පත්කර ඇත. | පනත ප්‍රකාරව මණ්ඩලයට පැවරි ඇති කාර්යයභාරය කාර්යක්ෂමව ඉටුකල යුතුය. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු.383,231,029 ක් වූ දේපල, පිරියත හා උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | යාවත්කාලීන කළ ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කරන ලෙසට නිලධාරීන් වෙත උපදෙස් දෙන ලදී. | යාවත්කාලීය කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අළුත්වැඩියාව සඳහා යොමුකර භාවිතයෙන් ඉවත් කරන ලද සේවා කිරීමේ අවශ්‍යතාවයක් නොමැති මුද්‍රණ යන්ත්‍රය සඳහා 2021 ජනවාරි 14 දින සිට 2023 ජනවාරි 13 දින දක්වා සේවා ගිවිසුම් අත්සන් කර රු.49,680 ක් ගෙවා තිබුණි. මුද්‍රණ ඒකකයේ දැනට | අදාළ මුද්‍රණ යන්ත්‍රය භාවිතයට ගත හැකි පරිදි අලුත්වැඩියා කරන ලද අතර, අදාළ යන්ත්‍රය මගින් ආයතනයේ සුළු මුද්‍රණ කටයුතු සිදු කරන ලදී. එම හේතුවෙන් සේවා ගිවිසුම් සිදු කරන ලදී. නව මුද්‍රණ යන්ත්‍රයේ අවශ්‍යතාවයන් අනුව සේවාවන් සිදු කොට ඇත. මාස 26ක කාලයක් සේවා සිදු නොකරන ලද යැයි සඳහන් වීම වැරදි සහගත වේ. වැඩි දුරටත් තොරතුරු ලබා දීමට අවශ්‍ය වී ඇතත් අදාළ ලිපිගොනුව | අංශ අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීමට අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම කළමනාකරණයේ වගකීමක් විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | භාවිතා කරන, වසරක වගකීම් කාලයක් සහිතව 2020 ජනවාරි 21 දින මිලදී ගත් රු.1,634,580 ක් වටිනාකමැති මුද්‍රණ යන්ත්‍රය 2020 සැප්තැම්බර් 03 දින සේවා කිරීමෙන් පසුව, යලි සේවා කිරීම සඳහා සේවා ගිවිසුමකට එළඹ නොතිබුණි. මිලදීගත් දිනයේ සිට එක් වරක් පමණක් සේවා කර තිබුණු මුද්‍රණ යන්ත්‍රය 2022 නොවැම්බර් වන විට මාස 25 ක කාලයක් සේවා කිරීමකින් තොරව මුද්‍රණ කටයුතු සඳහා භාවිතා කර තිබුණි. | රජයේ විගණන අංශය විසින් ගෙන ගොස් ඇති බැවින් ලිපිගොනු පරීක්ෂා කිරීමකින් තොර ව පිළිතුරු ලබා දීමට හැකියාවක් නොමැත. | |
| (ආ) | 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මුද්‍රණය කල රු.2,011,363 ක් වටිනා මණ්ඩලීය ප්‍රකාශන 7,506 ක තොගයක් 2022 නොවැම්බර් 24 දිනවන විටත් බෙදා නොහැර තිබුණි. | මණ්ඩලයීය ප්‍රකාශන ඉතිරි තොග අවම කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. ඉදිරියේදී ග්‍රන්ථ නාමාවලිය හා ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව විවිධ වැඩමුළු හා සම්මන්ත්‍රණවල දී ඉගෙනුම් ද්‍රව්‍ය ලෙස පරිත්‍යාග කිරීමටත්, වැඩසටහන්වලට පැමිණෙන විද්වතුන්ට ලබා දීමටත් නියමිතය. | අවශ්‍යතාවය හඳුනාගෙන මුද්‍රණ කටයුතු සිදුකිරීම හා පවතින පොත් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන ගොඩනැගිල්ල නවීකරණය කිරීම 2018 ජනවාරි 24 දින සිට මාස 09 ක කාලයකින් නිම කිරීමට රු.211,937,795 ක් වූ බදු රහිත කොන්ත්‍රාත් මුදලකට අධ්‍යාපන අමාත්‍යාංශය කොන්ත්‍රාත් සමාගමක් සමඟ ගිවිසුම් ගත වී තිබුණි. 2020 වර්ෂය අවසාන වනවිට සමාගම වෙත රු.252,463,612 ක් ගෙවා තිබූ අතර අවස්ථා 03 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරගෙන තිබුණි. එහෙත් 2021 මාර්තු මාසයේදී කොන්ත්‍රාත්තුව අතරමඟ නවතා දමා තිබුණි. 2021 ජනවාරි 05 දිනැති අංක 15-02-07 දරන සභාපතිගේ ලිපියෙන් ප්‍රධාන කරුණු 18 ක් හා බිම් මහලේ සිට සිව්වන මහල දක්වා අසම්පූර්ණ හා නියමිත පරිදි නිම නොකළ කොන්ත්‍රාත් කාර්යයන් හඳුනාගෙන තිබුණු නමුත්, 2022 නොවැම්බර් 09 දින වන විටත් එම අඩුපාඩු සම්පූර්ණ කර | හිටපු සභාපති විසින් කොන්ත්‍රාත් සමාගමේ කටයුතු නවතා දමා නාවික හමුදාවට එම කාර්යය පවරන ලෙස අමාත්‍යාංශ ලේකම් දැනුවත්කර ඇත. දැනට අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි ඉදිකිරීමට නියමිත වැඩ කොටස් හා එහි වැය ඇස්තමේන්තුවක් සකස්කර මණ්ඩලයට බාරදී ඇත.ඒ අනුව අවශ්‍යය ප්‍රතිපාදන ලබාගැනීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට නියමිතය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

නොතිබුණි. ඒ හේතුවෙන් සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන, ප්‍රතිග්‍රහණ, ග්‍රන්ථ විඥාපන හා පාලන අංශවල කටයුතු 2018 වර්ෂයේ සිට තාවකාලික ස්ථානවල සිදුකිරීම නිසා එම අංශවල දායකත්වය මණ්ඩලයේ අරමුණු ඉටුකර ගැනීමට ප්‍රමාණවත් පරිදි යොදා ගැනීමට නොහැකි වී තිබුණි.

## 4. යහපාලනය

### 4.1 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ අනුමත කාර්යමණ්ඩලය 197 ක් හා ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතික හා ප්‍රාථමික වශයෙන් පිළිවෙලින් පුරප්පාඩු 04 ක් 08 ක් 33 ක් හා 13 ක්ව පැවතුණි. 2022 ඔක්තෝබර් 31 දිනවන විට එම තත්ත්වය පිළිවෙලින් 04 ක් 09 ක් 36 ක් හා 16 ක් ලෙස සංශෝධනය වී තිබුණි. | පවත්නා සේවක හිඟය නිසා ආයතනයේ කටයුතු පවත්වාගෙන යාම දුෂ්කර වී ඇති බැවින් බඳවා ගැනීමේ මූලික කටයුතු සිදු කර ඇති තනතුරු සඳහා සුදුස්සන් බඳවා ගැනීමට අවශ්‍යය අනුමැතිය භාණ්ඩාගාර ලේකම්ගෙන් ඉල්ලුම් කර ඇත. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමට ක්‍රියාකල යුතුය. |